රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය
அரசாங்க நிருவாகச் சுற்றறிக்கை
Public Administration Circular

අංක
இல.
No. } 64

# ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සේවය කිරීම සඳහා මුදාහරින ලද රාජ්‍ය නිලධාරීන්ට අතිරේක පාරිශ්‍රමිකයන් ගෙවීම

## நியதிச் சட்டமுறையான சபைகளுக்கும் யாக்கங்களுக்கும் விடுவிக்கப்பட்ட அரச உத்தியோகத்தர்களுக்கு மேலதிக ஊதியம் கொடுத்தல்

## Payment of Extra Remuneration to Staff Officers released to Statutory Boards and Corporations

ආයතන මාලා අංක
தாபனத் தொடர் இல.
Establishments Series No. } 48

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

මිල/விலை/Price : -/10 තැපැල් ගාස්තුව/தபால் செலவு/Postage : -/15

Cir no - 64

මගේ අංකය : 544 ඊ 143/5 ඕඕ/ඕඒ.
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුව,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7,
1973 මාර්තු මස 17 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි.

**ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සේවය කිරීම සඳහා මුදාහරින ලද රාජ්‍ය නිලධාරීන්ට අතිරේක පාරිශ්‍රමිකයන් ගෙවීම**

1\. "අතිරේක පාරිශ්‍රමිකයන් මත සියයට 33 1/3 ක සීමාව" යන විෂය පිළිබඳ 1969. 10. 14 දිනැති භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය අංකය: ආයතන 95 කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

2\. ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල, තාවකාලිකව සේවය කිරීම සඳහා මුදාහරින ලද රාජ්‍ය නිලධාරීන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය පිළිබඳ පහත දැක්වෙන තීරණ රජය විසින් ගෙන ඇත :—

2 : 1 ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සේවය කිරීම සඳහා, තාවකාලිකව මුදාහරින ලද රාජ්‍ය නිලධාරීන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය, ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ 12 වැනි වගන්තියේ නියමකර දක්වා ඇති පරිදි රාජ්‍ය සේවයේ තනතුරුවල වැඩ බලන රාජ්‍ය නිලධාරීන්ට අදාළ වන වැඩ බැලීමේ වැටුප් රීතිවලට අනුකූල විය යුතුය. තවද,

2 : 2 ව්‍යවස්ථාපිත මණ්ඩලවල සහ සංස්ථාවල සේවය කිරීම සඳහා දැනටමත් මුදාහරිනු ලැබ ඇති රාජ්‍ය නිලධාරීන්ට, තමන්ගේ මුදාහැරීමේ කාලය අවසන් වන තුරු, දැනට ගෙවනු ලබන පාරිශ්‍රමිකය තවදුරටත් ගෙවනු ලැබේ.

3\. සංස්ථාවක සේවය කිරීම සඳහා ඕනෑම රාජ්‍ය නිලධාරියෙකු මුදාහැරීමේ කාලය අවුරුදු දෙකකට සීමා වන බව සටහන් කර ගත යුතුය.

4\. 1 වැනි ඡේදයෙහි සඳහන් කරනු ලැබූ භාණ්ඩාගාර චක්‍රලේඛ ලිපිය මෙයින් අවලංගු කරනු ලැබේ.

5\. සියලුම ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සංස්ථා (මහ බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ විශ්ව විද්‍යාල, ඇතුළුව) විසින් පිළිපැදීම සඳහා, මෙම තීරණ ඒවායේ අවධානයට යොමු කරවන ලෙස ලේකම්වරුන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

බී. මහාදේව

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ ස්වදේශ
කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්.

යෝ 22727—10,010 (73/6)